**ශීර්ෂය 119 - විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ2018දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018දෙසැම්බර් 31 දිනට විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේඅභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟසැසඳීමක් කළ නොහැක. තවද, එ් හේතුවෙන්ම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශද මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර නැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

---

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම |
|---|---|---|
| **2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව දේපල පිරියත හා උපකරණවටිනාකම රු.299,538,945 ක් වූ අතර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන අනුව එමවටිනාකම රු.290,051,919 ක් වීම හේතුවෙන්රු.9,487,026 කවෙනසක් නිරීක්ෂණය විය.** | **වෙනසට හේතු හඳුනාගෙන ගැලපීම් කළ යුතු වීම.** | **වෙනසටහේතු හඳුනාගෙන ඇති අතර ඉතා කඩිනමින් ගිණුම් ගත කර නිවැරදි කිරීමට ක්‍රියා කරන බව.** |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින්හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | අදාල මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මුදල් රෙගුලාසි 891(1) අනුකූලව ඇප තැබීමහා ඇප ලේඛනයක් පවත්වාගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව. |

### 1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2010 මැයි 14 දිනැතිඅංකසීඒ/1/17/1 දරනජනාධිපතිකාර්යාලයීයරාජ්‍යවියදම්කළමනාකරණයපිළිබඳචක්‍රලේඛය. | එම චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන් කරනු ලබන උපරිම නිල වාහන ප්‍රමාණය 03 ක් විය යුතු වුවද ඊට අනුකූල නොවන පරිදි අමාත්‍යවරයා සඳහා වාහන 04 ක් වෙන් කර තිබූ බව නිරීක්ෂණය විය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | 2018 වර්ෂයේ දෙසැම්බර් 23 තෙක් පමණක් වාහන 04 ක් පරිහරණය කර ඇති බවත් ඉන් පසු චක්‍රලේඛය ප්‍රකාරව හිමි වාහන 03 පමණක් භාවිතා කළ බව. |
| (ආ) | 2018 අංක 18 දරනජාතිකවිගණනපනතේ 16(2) උපවගන්තිය. | පනතේ අදාල වගන්තිය ප්‍රකාරව මුල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පනත ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. | ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරන බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් පිළියෙල කර තිබුණු අග්‍රිම ඇස්තමේන්තුව අනුව සමාලෝචිත වර්ෂය සඳහා ඉල්ලුම් කළ යුතු අග්‍රිමය රු.4,655,000 ක් වූ අතර තථ්‍ය වශයෙන් ඉල්ලුම් කළ අග්‍රිමය රු.905,944,000 ක් විය. ඒ අනුව ඉල්ලුම් කළ යුතු අග්‍රිමය හා ඉල්ලුම් කල අග්‍රිමය අතර සියයට 207 ක විචලනයක් නිරීක්ෂණය විය. තවද ඉල්ලුම් කළ අග්‍රිමයෙන් රු.757,448,330 ක් පමණක් භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණි. | අග්‍රිම අවශ්‍යතාවයන් නිවැරදිව සැළසුම් කළ යුතු වීම. | අග්‍රිමඅවශ්‍යතාවයනිවැරදිවසැලසුම්කරතිබුණත්ඉල්ලුම්කරනුලබනමාසිකඅග්‍රිමයභාණ්ඩාගාරමෙහෙයුම්දෙපාර්තමේන්තුවෙන්අදාලමාසයතුලදීමනිදහස්නොකිරීමහේතුවෙන්මෙමතත්ත්වයඇතිවීමවැලැක්වියනොහැක. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දී ව්‍යාපෘති වැය ශීර්ෂයන් 04 ක් සඳහා වෙන් කරන ලද රු.37,100,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණු අතර ඉකුත් වර්ෂයේදී ද මෙම ව්‍යාපෘති 04 සඳහා වෙන් කරන ලද රු.16,914,000ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. ඒ සඳහා ඇස්තමේන්තු කිරීමේ දුර්වලතා හා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් හේතු වී ඇති බවට විගණනයේදී නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වීම. | විගණන වාර්තාවේ කරුණු සමඟ එකඟ වේ. |

| | | |
|---|---|---|
| (ආ) පුනරාවර්තන හා මූලධන වැය විෂයයන්හි සලසා තිබූ ප්‍රතිපාදන ඉතිරිවීම් සියයට 10 සිට සියයට 92 දක්වා පරාසයක් තුල විහිදී තිබූ අවස්ථාවන් නිරීක්ෂණය වූ අතර වැය විෂයයන් 14 කට අදාලව එලෙස ඉතිරි වී ඇති මුළු ප්‍රතිපාදනවල වටිනාකම රු.136,933,133 ක් විය. මේ සඳහා ඇස්තමේන්තු කිරීමේ දූර්වලතා හා ක්‍රියාත්මක වීමේ ප්‍රමාදයන් හේතු වී තිබූ අතර ඍජු වියදම් ගිණුම් ගත කිරීමේ නිසි ක්‍රමවේදයක් නොමැති වීම මීට හේතු වී තිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | -එම- | ඉතිරි වී ඇති මුළු ප්‍රතිපාදනවල වටිනාකමරු.136,933,133 ක් ලෙස සංශෝධනය විය යුතු බව හා ඍජු වියදම් ගිණුම් ගත කිරීම නිවැරදිව සිදු කිරීම සඳහා අදාල අංශ දැනුවත් කර ඇති බව. |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුළ සැලැසුම් කළ පරිදි භාණ්ඩාගාරය විසින් අග්‍රිම නිකුත් නොකිරිම සහ අනෙකුත් වෙනත් හේතූන් මත වැය විෂයයන් දෙකකට අදාලව මුළු ප්‍රතිපාදනයෙන් සියයට 26 ක් සහ සියයට 57 ක ඉතිරියක් නිරීක්ෂණය විය. | වර්ෂය අවසානය වන තෙක් ප්‍රමාද නොකර ව්‍යාපෘති ආරම්භ කළ යුතු වීම. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වේ. |

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්
---------------------------------

පහත සඳහන්නිරීක්ෂණයන් කරණු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මෙ.වො. 31 මොරගොල්ල ජල විදුලිබලාගාරය ඉදිකිරීම<br>-------------------------------------------<br>මෙගා වොට් 31 ක ධාරිතාවයක් ජාතික විදුලි ජාලය වෙත ලබාගැනීම සඳහා ක්‍රියාත්මක මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීමට අදාල ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කළ ද අවුරුදු 3 ක ප්‍රමාද කාලයෙන් පසුව මෙහි වැඩකටයුතු 2017 වර්ෂයේ දී ආරම්භ කර තිබුණි. ඒ සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් රු.මිලියන | නියමිත කාලවකවානු තුල ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර අදාල කාල රාමුව ඇතුලත ව්‍යාපෘති නිම කිරීම කළ යුතු වීම. | ව්‍යාපෘතියේ උපදේශන සේවා කොන්ත්‍රාත්තුව අවුරුදු 02 ක් පමණ ප්‍රමාද වීම,පාරිසරික ඇගයීම් වාර්තාව ලබාදීම ප්‍රමාදවීම,මූලික වැඩ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් සිටීම යන කරුණු බලපාන ලද බවහා 2023 දී බලගැන්වීමට නියමිත බව. |

| | | |
|---|---|---|
| **16,780** ක මුදලක් ලැබී තිබුණු අතර මෙම ව්‍යාපෘතිය නියමිත දිනට ආරම්භ නොකිරීම හේතුවෙන් ලබාගත් ණය මුදල් වෙනුවෙන් රු.මිලියන **28** කට ආසන්න මුදලක් **(USD 177,931)** දණ්ඩන ලෙස **(CommitmentCharges)** ගෙවීමට සිදුව තිබුණි. | | |
| ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා සංවර්ධන ව්‍යාපෘතිය<br>------------------------------------------<br>මෙම ව්‍යාපෘතිය **2015** ජනවාරි මස ආරම්භ කර **2018** ජනවාරි මස නිම කිරීමට නියමිතව තිබුණ ද **2019** අගෝස්තු **21** වන විටද නිම කර නොතිබුණි. | -එම- | මෙම ව්‍යාපෘතියේ උපදේශනය සඳහා වූ විෂය පථය **JICA** ආයතනය සමඟ සාකච්ඡා කොට එකඟතාවයකට පැමිණීමට ප්‍රමාද විය. ඉන්පසුව කොන්ත්‍රාත් කරුවන්ගේ පූර්ව සුදුසුකම් **(PQ)** සඳහා **JICA** අනුමැතිය ලබාගැනීමට හා ටෙන්ඩර් ලේඛන සඳහා **JICA** අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද වීම යන කරුණු හේතු වූ බව. |
| මෙ.වො. **35** බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය<br>------------------------------------------<br>මෙම ව්‍යාපෘතිය **2013** අගෝස්තු ආරම්භ කර **2017** අගෝස්තු නිම කිරීමට නියමිතව තිබුණ ද **2018** දෙසැම්බර් **31** දින වන විට ද මෙහි භෞතික ප්‍රගතිය සියයට **66** ක් පමණක් විය. මෙදින වන විට මෙම ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත පිරිවැය වූ රු. මිලියන **9,424** න් රු. මිලියන **6,426** ක් උපයෝජනය කර තිබුණි. | -එම- | මෙම ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රමාද වීම , සමාජීය ගැටළු උද්ගත වීම සහ **ICBC** බැංකුව විසින් මුදල් ලබාදීම තාවකාලිකව අත්හිටුවීම යන කරුණු නිසා ව්‍යාපෘතිය ප්‍රමාද වූ බව. |
| මන්නාරම සම්ප්‍රේෂණ මාර්ගයේ යටිතල පහසුකම් ඉදිකිරීම ලොට් ඒ : වව්නියා ග්‍රිඩ් උපපොල වැඩිදියුණු කිරීමේ හා මන්නාරම ග්‍රිඩ් උපපොල ඉදිකිරීම<br>------------------------------------------ | -එම- | මන්නාරම් ජාල උපපොල ඉදිකිරීම සඳහා වූ පැකේජයේ විෂය පථය, |

| | | |
|---|---|---|
| මෙම ව්‍යාපෘතිය 2015 වර්ෂයේ ආරම්භ කර 2017 වර්ෂයේනිම කිරීමට නියමිතව තිබුණ ද 2018 දෙසැම්බර් 31 දින වන විට ද මෙහි භෞතික ප්‍රගතිය සියයට 84 ක් පමණක් විය. මෙදින වන විට මෙම ව්‍යාපෘතියෙහිඇස්තමේන්තුගත පිරිවැය වූරු.මිලියන 4,149 න් රු. මිලියන 2,507 ක් වැය කර තිබුණි. | | ව්‍යාපෘති කාල සීමාව අතරතුර වෙනස්වීම හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද වූ බව. |

**3.2** රජයේ නිලධාරීන් ඇප තැබීම
-------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>------------ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>----------------------------------------- |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව අමාත්‍යාංශයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩුබාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද, අමාත්‍යාංශයේ ගිණුමට අදාල වව්චර, සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 හා 881 ප්‍රකාරව නිලධාරියෙකු එවැනි තනතුරකට පත් කළ දින සිට දෙමසක් ඇතුලත ඇප තැබිය යුතු වීම. | 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරින්ගේ ඇප ආඥාපනතට අනුකූලව සහ මුදල් රෙගුලාසි 891(1) අනුව ඇප තැබිම සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව. |

**4.** මානව සම්පත් කළමනාකරණය
---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------- | ------------ | ---------------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු 24 ක් පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය. | පුරප්පාඩු පිරවීමට හෝ ඒවා සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. | පුරප්පාඩු 24 ක් පවතී. |
| (ආ) | 2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/1 දරන ජනාධිපති කාර්යාලීය රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛයේ 2.2 ඡේදය ප්‍රකාරව ගරු අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සඳහා රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනයක නිළධාරියෙකු අනුයුක්ත කරගන්නේ නම් ඔහුට ගෙවිය යුත්තේ ඔහු එම ආයතනයේ ලබමින් සිටින වැටුප නොව අනුයුක්ත කරන ලද තනතුරට අදාල වැටුප් වේ. නමුත් ඉහත චක්‍රලේඛයට පටහැනිව අමාත්‍යංශය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ රියදුරු මහතෙකුගේ සේවය ලබාගෙන ඔහු වෙනුවෙන් ඉහල වැටුපක් එනම් 2017 දෙසැම්බර් මාසය සඳහා රු.167,392 ක වැටුපක් සහ 2018 වර්ෂය සඳහා රු.1,834,801කවැටුපක් අමාත්‍යාංශය විසින් ගෙවා එය ප්‍රතිපූර්ණය කර තිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි අනුයුක්ත කර ඇත. |